Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

Swiss Agency for Development and Cooperation SDC

UN WOMEN

ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ගෘහ සේවිකාවන් බලගැන්වීම

2012 සහ 2018 අතර,
සංක්‍රමණික ශ්‍රමිකයින් 1,813,226 අතුරින්

40.2%ක් කාන්තාවන් වූහ

සිය වැටුප නිත්‍ය වශයෙන්ම පුරුෂයන්ට වඩා අඩුව තිබිය දීත්, 2016 දී ගණන් බලා ඇති ගෝලීය මුදල් ප්‍රේෂණ US$ බිලියන 601න් දළ වශයෙන් අඩක් සඳහා ගෝලීයව දායක වන්නේ සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින්ය.

2014 දී දළ ජාතික නිෂ්පාදනයෙන් 9.6%ක් ද, විදේශ තැන්පත් වලින් 86%ක් සඳහා ද දායක වී ඇත්තේ විදේශ මුදල් ප්‍රේෂණයන්ය.

කෙසේනමුත්, සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින් විසින් එවන ලද මුදල් ප්‍රේෂණ පිළිබඳ ජාතික දත්තයන් නොමැත.

රූපය 1 : කාන්තා ගෘහ සේවිකාවන් සංක්‍රමණය වීමේ නවතම ප්‍රවණතා



සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින් සුවිශාල දයකත්වයක් ලබාදෙන නමුත්, ඔවුන්

- බඳවා ගැනීමේ ආයතන/නියෝජිතයින්/අතරමැදියන් ගේ සූරාකෑමේ අවදානමට ලක්වේ.
- බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය තුල ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සංවේදිතාවයක් නොමැති වීම නිසා නියමිත සංක්‍රමණ ක්‍රියාවලියේදී වෙනස්කම් කිරීම් වලට ලක්වේ.
- බඳවා ගැනීමේ ආයතන මගින් ගමනාන්ත රටේදී පළමු ගිවිසුම් වෙනස්කොට ආදේශ කිරීම සිදුකෙරේ.
- අඩු වැටුප් සහිතව ඉතා දිගු වේලාවක් සේවයේ යොදවයි.
- භාෂා සහ සංස්කෘතික බාධක වලට මුහුණ දෙයි.
- සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින්, විශේෂයෙන්ම ගෘහ සේවිකාවන්, සංචරණයේ සහ සංගම්වලට බැඳීමේ සීමාවන්ට මුහුණ දෙයි.
- සාමූහික කේවල් කිරීමේ හැකියාව සීමාසහිත හෝ හැකියාවක් නොමැත
- ප්‍රමාණවත් නොවන ආහාර, පහත් තත්වයේ නවාතැන් සහ සෞඛ්‍ය පහසුකම්
- ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසනයට වැඩි අවදානමක්, සහ නිදහස හා පුද්ගලිකත්වය නොමැතිවීම.

කාන්තාවන්ගේ හඬ

“ kjil yñlr .ekfï udf. iykh ienElr .ekug wjYH j kidu uu udf. ijÈ wrdì fijHhdf. ldhl wmfhdckhk iy udkil mvdjk ky~j bjid iáfhñ' ”

“ lfõgfh uf. fijHhd fjki lßug ud .; ;rKh kid udj n,y; ldrfhk r|jd .k ,eîh' udf. .uk n,m;h rdcik;l l< w;r jegm w;ygjk ,§' ud mekhdug ;e;l< úg fmd,ifhk w,,d ir.; lrk ,§' ug kej; uõrg n,d meñ ,h yel jfh ;dkdm; ld¾hd,fh kjd;ekl udi .Kkl .;l< mijh' ”

“ WfKk fmf,ñk" jukh lrñk i;hlg jeä ld,hl frd.j iá ud ffjoH jrfhl fj; f.k .fh ke;' uf. fijHhd úik kjfi ;n fm; j¾.hl ug ,nd ÿk ku; t fudkjd±h ud fkdokkd kid uu tjd fkd.;f;ñ' ”

අයිතිය අත් හැරීමේ ප්‍රකාශය : මෙහි පලකර ඇති අදහස් ඒ ඒ අයගේ පුද්ගලික අදහස් වන අතර ඒවා එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය හෝ එක්සත් ජාතීන් හෝ එහි අනුබද්ධ ආයතනවල අදහස් නියෝජනය නොකරනවා විය හැකිය.

කුමක් කළ හැකිද?

බලගැන්වීම

පවුල් පසුබිම් වාර්තාව අවලංගු කරමින් කාන්තාවන්ගේ සංචරණයට ඇති වෙනස්කම් කරන සුළු බාධකයන් ඉවත් කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලතා දක්වන සදාචාරාත්මක බඳවාගැනීමේ පිළිවෙත් ආයතනගත කිරීම

ජාතික කම්කරු සංක්‍රමණ ප්‍රතිපත්තිය තුල කාන්තාවන් ආරක්ෂා කිරීමේ පියවර නිශ්චිත ලෙසම සඳහන් කිරීම

අතරමැදියන්ට ඉඩ නොලැබෙන පරිදි අන්තර්ජාලය හරහා බඳවාගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම

සංක්‍රමණික කාන්තාවන් සඳහා සිය ජයග්‍රහණයන්, අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඬගා පැවසීමට හැකි වේදිකාවක් නිර්මාණය කිරීම

ආරක්ෂාව

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන රැකියා ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම

ජාතික සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුල ලිංගික සහ ප්‍රජනන අයිතීන්ට අනුකූලතාවය දක්වන වලක්වා ගැනීමේ ක්‍රමෝපායන් හඳුන්වා දීම

කම්කරු සංක්‍රමණයන් පිළිබඳව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලතා දක්වන ගෝලීය සහ කලාපීය වේදිකාවන් සවිමත් කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අනුකූලතා දක්වන ද්විපාර්ශවීය ගිවිසුම් සහ අවබෝධතා ප්‍රකාශ වැඩියෙන් ඇතිකර ගැනීමට කථිකාවන් ඇති කිරීම: නිදසුනක් ලෙස, සවුදි අරාබි රාජ්‍යය සහ ශ්‍රී ලංකාව සමග පවතින ද්විපාර්ශවීය ගිවිසුම.

හැකියාවන් ගොඩනැගීම

දුක්ගැනවිලි පිළිබඳව සලකා බැලීමේ යාන්ත්‍රණයන් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල දක්වා විමධ්‍යගත කිරීම මගින්, කාන්තාවන් ඇතුළු සෑම සංක්‍රමණික ශ්‍රමිකයෙකුටම දුක්ගැනවිලි පිළිබඳ යාන්ත්‍රණයන් වෙත පිවිසීමේ හැකියාව තහවුරු කිරීම

ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා ඉලක්ක කර ගත් ශක්තිමත්, විශේෂිත සහතික කිරීමේ සහ නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් නිර්මාණය කිරීම

සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින් අත්දකින ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්වූ හිංසනය වැනි ගැටළු වලට විසඳුම් ලබාදිය හැකිවන පරිදි තානාපති කාර්යමණ්ඩල පුහුණු කිරීම